පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 492

ආයතනයේ නම : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வினா இலக்கம் 492

நிறுவனத்தின் பெயர்: இலங்கைப் பரீட்சைத் திணைக்களம்

பாராளுமன்றத்தில் அரச கணக்குகள் தொடர்பான செயற்குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரது அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் குறித்த விபரங்களை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 492

Name of the institution : Department of Examinations

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)

Format Number 01

Parliament Serics Number - 492

Name of Institution - Department of Examinations

| | Shortcomings Identified by the report ( Parliamentary Serics Number 492) | Action taken by Institution to rectify the short Comings/Current Status |
|---|---|---|
| 01 | Failure to maintain the Risk Register in an updated manner. | Information has been collected from each branch, and actions have been taken to update the Risk Register accordingly. |
| 02 | Instances were reported where responses to internal audit queries were not provided within one month. | Owing to circumstances such as the Easter Sunday attacks, the COVID-19 pandemic, and natural disasters including floods, national examinations could not be conducted within the scheduled timeframes in previous years. Consequently, a considerable number of postponed examinations were conducted during the previous year and continue to be conducted during the current year. As a result, officers of all branches of this Department are required to be deployed for examination-related duties. Due to the deployment of officers for examination-related duties in this manner, delays were, at times, experienced in providing responses to audit queries. As a large number of postponed examinations have now been conducted and completed, instructions have been issued to the |

| | | |
|---|---|---|
| | | officers to ensure that responses to audit queries are provided within the stipulated timeframes in the future. |
| 03 | Information relating to assets purchased and disposals made in the year 2018 had not been submitted to the Comptroller General, as required under paragraph 7 of the Assets Management Circular No. 1/2017 dated 26.06.2017. | At present, the NFAMS software in operation provides facilities for reporting only vehicle assets. No vehicle purchases or disposals have been carried out during the current year. The existing vehicles have been duly reported in the prescribed manner. Actions will be taken accordingly upon the provision of facilities for reporting other assets in the future. |
| 04 | The Annual Board of Survey had not been conducted in accordance with Financial Regulation 756(6), and the relevant reports had not been submitted to the Auditor General within the stipulated time frame as specified in paragraph 11.1 of Part I of Public Finance Circular No. 01/2020 dated 28.08.2020. | Due to the conduct of the G.C.E. (Advanced Level) Examination for 2025 in November 2025 and the G.C.E. (Ordinary Level) Examination in February 2026, together with restrictions imposed on access to the confidential branches of the Department and the heavy engagement of all officers, the physical verification for the Board of Survey as at 31.12.2025 could not be carried out until the end of March 2026. Accordingly, the Board of Survey process has been delayed. However, as the said activities have now been completed and the relevant actions relating to the disposal by auction are in progress, the |

| | | |
|---|---|---|
| | | relevant report will be submitted within the month of June. |
| 05 | Daily running charts and monthly summaries relating to pool vehicles had not been submitted to the Auditor General. | Steps have been taken to ensure that the running charts of all vehicles currently in operation are duly completed, and instructions have been issued to officers to have Forms General 268 and General 268(a) signed by the Officer-in-Charge of Vehicles and submitted accordingly.<br>It was observed that, due to a certain running charts not being submitted for audit during the year 2025 having been handed over to the Internal Audit branch, all running charts could not be presented to the Government Audit Office for audit. The staff have been informed to establish a systematic procedure in this regard in the future. |
| 06 | The national emblem had not been painted on all vehicles. | Actions have been taken to affix the State Emblem on all vehicles, other than those allocated for departmental officers. |
| 07 | There were outstanding loan balances that had been carried forward for more than one year. | Actions are currently being taken to settle the same. |

| | | |
|---|---|---|
| 08 | The Citizens'/Clients' Charter had not been properly prepared and implemented in accordance with the Circular No. 05/2008 dated 06.02.2008 of the Ministry of Public Administration and Management, as amended by Circular No. 05/2018(1) dated 24.01.2018. | Actions are currently being taken to prepare the Citizen Charter. Information relating to the functions performed by each branch has been called for, and required information has already been submitted by most Divisions. The remaining information will also be obtained from the relevant branches, and further actions will be taken accordingly. |
| 09 | The prepared Human Resource Plan had not ensured that at least 50% of the staff were provided with a minimum of 12 hours of training per year. | Due to the severe economic difficulties prevailing in the country during the year 2023, and in order to manage government expenditure, Sub-paragraph 06(a) of Public Finance Circular No. 01/2023 dated 27.01.2023, issued in this regard, fully suspended the participation of officers in all foreign training courses, seminars, etc., funded by the Consolidated Fund of the Government. Furthermore, Sub-paragraph 06(c) of the said Circular imposed strict limitations also on the provision of local training opportunities under staff training expenditure. (Annex 01)<br><br>Accordingly, although provisions had been allocated under the Head of Expenditure of the Department of Examinations, Sri Lanka for staff training for the financial year 2023, due to the requirement to comply with the provisions of the |

| | | |
|---|---|---|
| | | aforesaid Circular, it was not possible, under the Human Resource Development Plan, either to ensure a minimum of 12 hours of training for more than 50% of the staff or to provide training opportunities to the staff as planned. |
| 10 | Declarations of Assets and Liabilities of all officers had not been furnished. | The lists of all officers required to submit Assets and Liabilities Declarations for the year 2025 have been forwarded to the Commission to Investigate Allegations of Bribery or Corruption. The Assets and Liabilities Declarations for the year 2026 are required to be submitted individually by each officer through the online system before 30.06.2026. |
| 11 | Officers who had completed the maximum service period had not been duly transferred. | The functions of this Department are not carried out through ordinary office procedures, but consist of a range of processes primarily focused on the organization, conduct of examinations, and release of results. These functions are required to be performed while ensuring confidentiality and maintaining the highest level of trust and integrity. Accordingly, the services of experienced and well-trained staff are essential for the effective functioning of this Department. |

| | | |
|---|---|---|
| | | The simultaneous transfer of a large number of experienced officers and the replacement thereof with new staff may require a considerable period for such officers to adapt to the functions of the Department, which may in turn have an impact on the effectiveness of the above-mentioned processes.<br><br>In order to acquire specialized knowledge relating to the conduct of examinations and evaluation activities, officers of the Sri Lanka Education Administrative Service serving in this Department participate in both local and foreign training programmes. However, due to transfers within short periods, the knowledge acquired by officers through such training programmes, as well as the costs incurred therefor, cannot be effectively utilized.<br><br>Transfers in respect of the Combined Services, namely the Management Service Officers' Service, Information and Communication Technology Service, Development Officers' Service, and Office Employees' Service, are also carried out in an orderly manner in accordance with the annual transfer procedure. |

| | | |
|---|---|---|
| | | However, since the transfer of experienced officers in relation to the functions of this Department has a direct impact on the examination administration process, transferred officers are released from the Department only after the arrival of the successor officer and after providing a certain level of training to newly recruited officers.<br><br>In respect of the officers who were granted transfers under the Annual Transfer Orders for the year 2026, those for whom successor officers have reported for duty have already been released from service in this Department. Actions will be taken to release the remaining officers upon the reporting for duty of their respective successor officers. |

A.K.S. Indika Kumari Liyanage
Commissioner General of Examinations

A.K.S. Indika Kumari Liyanage
Commissioner General of Examinations
Department of Examinations
Pelawatta, Battaramulla.
Sri Lanka

ඇමුණුම - 01

# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/05/2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.01. 27

**අයවැය චක්‍රලේඛ අංක: 01/2023**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ප්‍රධානීන්

**2023 වසර සඳහා වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපා හැරීම හා රජයේ වියදම් කළමනාකරණය**

2023 වසර සඳහා ඇස්තමේන්තුගත රජයේ දළ ආදායම රැස්කිරීම සම්බන්ධයෙන් උද්ගතව ඇති දැඩි දුෂ්කරතා හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සඳහා රජයේ වියදම් වඩාත් අරපිරිමැසුම්දායී ලෙස භාවිතා කිරීම හා අත්‍යවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කිරීමේ අරමුණින් 2023 වර්ෂය සඳහා වෙන් කර ඇති පුනරාවර්තන වියදම්, අවම වශයෙන් සියයට 6 කින් කපා හැරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව, සියලුම වියදම් ශීර්ෂවලට අදාළව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් පහත ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වේ.

**02. සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු**

(අ) 2023 අයවැය ඇස්තමේන්තුවල පහත සඳහන් වැය විෂයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් කටයුතු කළ යුතු වේ.

| | වැය විෂය | වැය විෂය සංකේත අංකය |
|---|---|---|
| (i) | වැටුප් හා වේතන | 1001 |
| (ii) | වෛද්‍ය සැපයුම් | 1204 |
| (iii) | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 1404 |
| (iv) | විශ්‍රාමික ප්‍රතිලාභ | 1502 |
| (v) | දේශීය ණය සඳහා පොලී ගෙවීම් | 1601 |
| (vi) | විදේශ ණය සඳහා පොලී ගෙවීම් | 1602 |
| (vii) | භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම් | 1603 |
| (viii) | අත්‍යවශ්‍ය සුභසාධන ගෙවීම් (2(ආ)vi අනුව) සහ ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම්ගත බැඳීම් | |

(ආ) වියදම් අවම කිරීම සඳහා හඳුනාගත් ක්‍රමවේද ද අඩංගු සංශෝධිත වියදම් ඇස්තමේන්තු, ඇමුණුම් 1 හි ඇති ආකෘතියට අනුකූලව 2023.02.28 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ විෂයභාර මාණ්ඩලික නිලධාරියා වෙත, ආවරණ ලිපියක් සහිතව විද්‍යුත් තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) වියදම් අවම කිරීම සඳහා නීතිරීති හා රෙගුලාසි දැඩිව පිළිපැදීම සහ ඒ ඒ ආයතනවල ස්වභාවය අනුව භාවිත කළ හැකි උපක්‍රමික ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. පොදුවේ සියලු ආයතන විසින් පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

(i). පවත්නා සම්පත් උපයෝගී කර ගනිමින්, ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය (Business Process Reengineering), ප්‍රශස්ත තොග කළමනාකරණය (Optimum Inventory Management), තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය (Information Communication Technology), ඩිජිටල්කරණය (Digitalization), මාර්ගගත සේවා සැලසීම (On-line Service Delivery) ආදී ක්‍රමවේද හඳුන්වාදීම මඟින් තම ආයතනයන්හි පුනරාවර්තන/මෙහෙයුම් වියදම් අවම කිරීම සඳහා කටයුතු කළ යුතු ය.

(ii). විදුලිය, ජලය, දුරකථන සේවා, ඉන්ධන සහ අනෙකුත් ගිවිසුම් ගත සේවාවන් සඳහා වන වියදම් අවම කිරීම පිණිස උචිත වියදම් පාලන ක්‍රමවේද යොදා ගැනීම හා එම සේවා උපයෝජනය පිළිබඳ විගණනය කිරීම කළ යුතු ය. එමෙන්ම, කාර්යාලයීය අවශ්‍යතා මිලදී ගැනීම දැඩි පාලනයකට යටත් කළ යුතු වේ.

(iii). වැය විෂය සංකේතාංක 1002 - අතිකාල හා නිවාඩු දින වැටුප් සහ 1003 - වෙනත් දීමනා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ද අවම වශයෙන් සියයට 6 කින් අඩු කළ යුතු බැවින් අතිකාල වියදම් දැඩි සේ පාලනය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, අතිකාල හා නිවාඩු දින රාජකාරී කටයුතු සඳහා සත්‍ය සේවා අවශ්‍යතාවයක් පවතින බව හා අදාළ ගෙවීම් සඳහා හිමිකම් ලැබීමට සේවය කළ යුතු කාලය තුළ සත්‍ය වශයෙන්ම සේවයේ යෙදෙන බව, එම ගෙවීම් සඳහා බලය ලබා දෙන නිලධාරීන් විසින් අනිවාර්යයෙන්ම තහවුරු කර ගත යුතු වේ. එමෙන්ම, නිසි අධිකාරී බලයක් නොමැතිව අමාත්‍යාංශ හෝ ආයතන මට්ටමින් නිකුත් කරනු ලබන අභ්‍යන්තර උපදෙස් මත ගෙවනු ලබන දීමනා නතර කළ යුතු වේ.

(iv). වැය විෂය සංකේතාංක 1202 - ඉන්ධන, 1401 - ප්‍රවාහන හා 1408 - මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම් සම්බන්ධයෙන් වන වියදම් පාලනය සඳහා නිල වාහන හිමි නිලධාරීන්ට අනුයුක්ත කිරීම සඳහා ප්‍රමාණවත් වාහන ආයතනයේ සංචිත වාහන ලෙස පවතින අතරතුරදී, එම නිලධාරීන් වෙත අනුයුක්ත කිරීම සඳහා කුලී පදනම මත වාහන ලබා ගැනීම නොකළ යුතු ය. නිල වාහන අනුයුක්ත කිරීමේදී මෙන්ම භාවිතයේදී අනුමත නිල වාහන හිමිකම අනුව එක් වාහනයක් පමණක්, අනුමත ඉන්ධන සීමාව තුළ භාවිතා කරනු ලබන බවට හා නිල වාහන හිමි/නිල වාහන වෙනුවට මාසික ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන් වෙත කිසිදු අවස්ථාවකදී සංචිත වාහන ලබා නොදෙන බවට තහවුරු කරගෙන කටයුතු කිරීම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි.

(v). සංචිත වාහන භාවිතයද, මනා සැලසුමකින් යුතුව, අත්‍යවශ්‍යම කටයුතු සඳහා පමණක් සීමා කිරීමටත්, මාර්ගගත ක්‍රමවේද (online methods) හැකිතාක් භාවිතා කරමින් රැස්වීම්/සම්මන්ත්‍රණ/සාකච්ඡා පැවැත්වීම තුළින් ප්‍රවාහන අවශ්‍යතා පැන නැගීම සීමා කිරීමටත්, කටයුතු කළ යුතු ය. එමෙන්ම, කලාප/ප්‍රාදේශීය/උප-කාර්යාල මගින් පහසුවෙන් ආවරණය කළ හැකි රාජකාරී/සේවා අවශ්‍යතා වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් ප්‍රවාහන පහසුකම් සඳහා වියදම් දරමින් කටයුතු කිරීම අවම කළ යුතු ය.

(vi). මෙම චක්‍රලේඛය මගින් අරමුණු කරනු ලබන ප්‍රතිපාදන කපා හැරීම් පහත සුභසාධන වියදම් සඳහා අදාළ නොවේ.

- දුෂ්කර ආර්ථික වාතාවරණය හමුවේ පීඩාවට පත් පුද්ගලයන් සඳහා සහන සැලසීම
- සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු රෝගීන් සඳහා දීමනා සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා දීමනා
- ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ ආහාර පැකේජය, පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාරය, උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට පෝෂණ අතිරේකය
- ත්‍රිපෝෂ වැඩසටහන, පාසල් පෝෂණ වැඩසටහන ඇතුළු පාසල් සඳහා වන සුභසාධන වැඩසටහන්

එසේ වුවද, වැය විෂය සංකේතාංක 1501 යටතේ වන සුභසාධන වැඩසටහන්වල ප්‍රතිපාදන, ඉහත 2(ඇ) (I) හි සඳහන් නව ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම තුළින් හා ප්‍රතිලාභීන් "ඉලක්කගත කිරීමේ කාර්යක්ෂමතාවය" ඉහළ නැංවීම තුළින් ඉතිරි කිරීමට කටයුතු කළ යුතු වේ.

(vii). ඉතිරි කිරීම් ගණනය කිරීමේදී වැය විෂය සංකේතාංක අංක 1204 - වෛද්‍ය සැපයුම් නිදහස් කර ඇතත්, එම වැය විෂය යටතේ වියදම් දැරීමේදී විචක්ෂණශීලී තොග කළමනාකරණය (Prudent Inventory Management), නිසි පරිදි ඖෂධ ගබඩාකරණය (proper storing of medicines), තත්කාලීන වෛද්‍ය සැපයුම් දත්ත සහිත ඒකාබද්ධ තොරතුරු පද්ධතිය (Integrated Medical Supply Information System) නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා හදිසි මිලදී ගැනීම් සිදු නොවන පරිදි ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදය අවම කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

(viii). රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබා දෙන ණය පහසුකම් සම්බන්ධයෙන් ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 හි පවතින සීමාවන් තවදුරටත් එලෙසින්ම ක්‍රියාත්මක වේ.

## 3. පළාත් සභා

වැය විෂය සංකේතාංක 1507 - පළාත් සභා සඳහා ප්‍රදානයන්ට අදාලව ප්‍රතිපාදන කපා හැරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ඇත.

## 4. රජයේ අයවැයෙන් මූල්‍යනය වන ව්‍යවස්ථාපිත ආයතන

(අ) 1503 වැය විෂය යටතේ වෙන් වන ප්‍රතිපාදනවලින් වැටුප් හා වේතන අඩු කළ පසු ඉතිරි ප්‍රතිපාදනවලින් සහ 1509 වැය විෂය යටතේ වෙන් වන ප්‍රතිපාදනවලින් අවම වශයෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි කිරීමට මෙම ව්‍යවස්ථාපිත ආයතන විසින් කටයුතු කළ යුතු වේ. එහිදී ඉහත 2 (අ) සිට (ඇ) දක්වා වන විධිවිධාන සහ පහත 6 හි උපදෙස් අනුගමනය කළ යුතු වේ. මේ අනුව, සංශෝධනය කරනු ලබන වියදම් ඇස්තමේන්තු, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව, 2023.02.28 දිනට ප්‍රථම අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. (ඇමුණුම් 1 හි සඳහන් ආකෘති පත්‍රය සුදුසු පරිදි සංශෝධනය කර මේ කාර්යය සඳහා යොදා ගත හැකිය).

(ආ) රැස්කරන අරමුදල් රඳවා තබා ගැනීම සඳහා අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින් බලය ලැබී ඇති ව්‍යවස්ථාපිත ආයතන හැර අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන විසින් අය කරනු ලබන ගාස්තු හෝ රැස් කරනු ලබන **රජයේ ආදායම්** වහාම ඒකාබද්ධ අරමුදල වෙත මාරු කළ යුතු ය. මෙම ආයතන සඳහා අවශ්‍ය අක්මුදල්, වාර්ෂික ඇස්තමේන්තුගත සීමාවට යටත්ව භාණ්ඩාගාරය විසින් අවශ්‍යතාවය පරිදි සලසා දෙනු ලැබේ. එමෙන්ම, භාණ්ඩාගාරය විසින් මෙම ආයතන වෙත සලසා දෙනු ලබන මුදල්, තැන්පතු හෝ ආයෝජන ලෙස තබා ගැනීම සිදු නොකළ යුතු ය.

## 5. රජයේ අයවැයෙන් මූල්‍යනය නොවන ව්‍යවස්ථාපිත ආයතන

අංක 23/0100/604/007 දරන 2023.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය බැංකු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සමාගම් සහ අනෙකුත් රාජ්‍ය ව්‍යාපාරයන්හි 2023 වර්ෂය සඳහා අනුමත අයවැය ඇස්තමේන්තුවල පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදනවලින් සියයට 6 ක් අවුරා තැබීම මගින් වියදම් අඩු කර ගැනීම පිණිස වන උපදෙස්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ඇත.

## 6. පොදු උපදෙස්

(අ) ප්‍රදායක ආයතන විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන/ පුහුණු/ සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ සංචාර සඳහා දේශීය අරමුදල් මගින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගී නොකළ යුතු ය.

(ආ) පූර්ණ පිරිවැය, ප්‍රදායක ආයතන විසින් දරනු ලබන, විදේශ කටයුතු අමාත්‍යාංශය, හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් රජයේ නිලධාරීන්ට හිමිවන හෝ විදේශ කටයුතු අමාත්‍යාංශයේ හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියක් සහිතව එළඹ ඇති ගිවිසුම්/සම්මුතීන් යටතේ රජයේ නිලධාරීන්ට හිමිවන හෝ ශ්‍රී ලංකාව විසින් එළඹ ඇති ගිවිසුම්/සම්මුතීන් යටතේ නිශ්චිත ආයතනයකට හිමිවන, විදේශ අධ්‍යයන/පුහුණු/සාකච්ඡා/සම්මන්ත්‍රණ/සංචාර සඳහා 2015.05.15 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2015/01 යටතේ අනියම් දීමනා පමණක් ලබා දිය හැක.

[redacted] සඳහා වන වියදම් යටතේ දේශීය පුහුණු අවස්ථා ලබාදීමේදී සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි හා චක්‍රලේඛ විධිවිධාන අනුව, ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් එම පුහුණු අවස්ථා ලබා දිය යුතු වේ. එම පුහුණු කටයුතු පැවැත්වීම සඳහාම පිහිටුවා ඇති දේශීය ආයතන වෙත පමණක් නිලධාරීන් යොමු කළ යුතු ය. ඉහත ගණයට නොගැනෙන සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාමූහිකව නිලධාරීන් සඳහා සිදු කරන බාහිර යොමුගත පුහුණුවීම් (out bound trainings) යනාදිය වෙනුවෙන් රජයේ අරමුදල් භාවිතා නොකළ යුතු ය.

(ඈ) ඉහත සඳහන් පරිදි ප්‍රතිපාදන කපා හැරීමෙන් පසු සංශෝධිත ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවා අරපිරිමැසුම්දායී ලෙස වියදම් දැරීමට හැකි වන සේ වියදම් අවශ්‍යතා ප්‍රමුඛතාගත කිරීමට කටයුතු කළ යුතු වේ.

(ඉ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සියලු රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී මෙම චක්‍රලේඛයේ විධිවිධාන සහ සකසුරුවම් ලෙස වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී නිසි උපදෙස් ලබා දිය යුතු ය.

7. උද්ගතව පවත්නා අතිශය සීමාකාරී රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ රජයේ වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022, 08/2022, සහ 09/2022 මෙන්ම ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද PS/SB/Circular/10/2022 හා 2022.08.15 දිනැති චක්‍රලේඛ උපදෙස් සහ මෙම චක්‍රලේඛයේ විධිවිධාන තරයේ ක්‍රියාත්මක කරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් පෞද්ගලිකව සොයා බලා කටයුතු කළ යුතු බව ද අවධාරණය කරමි.

කේ. එම්. මහින්ද සිරිවර්ධන
**භාණ්ඩාගාර ලේකම්**

**පිටපත්:**

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව

## 2023 වියදම් ඉතිරි කිරීම පිළිබඳ විස්තර

වැය ශීර්ෂය :

වැඩසටහන :

ව්‍යාපෘතිය :

| වැය විෂය | 2023 ඇස්තමේන්තුව (රු. මිලියන) | යෝජිත ඉතිරි කිරීම් (රු. මිලියන) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තු (රු. මිලියන) | ඉතිරි කිරීම සඳහා අපේක්ෂිත පියවර/හඳුන්වාදෙනු ලබන නව ක්‍රමවේද |
|---|---|---|---|---|
| | | | | උදා:<br>1. ප්‍රශස්ත තොග කළමනාකරණය<br>2. මාර්ගගත සේවා සැලසුම<br>3. ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය |
| එකතුව | | | | |

දිනය: ප්‍රධාන ගණන්දීමේ නිලධාරී /ගණන්දීමේ නිලධාරීගේ අත්සන